00045

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**

**අධ්‍යාපන පීඨය**

**අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධි වැඩසටහන - පස්වන මට්ටම 2014/2015**

**අවසාන පරීක්ෂණය - 2016**

**ළමා අයිතිවාසිකම් – ESU3117**

**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2016 අප්‍රේල් 09** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. ක්‍රි.ව.1930-1948 අතර කාලයේදී ක්‍රියාත්මක කරනු ලැබූ ළමා සුභසාධනයට අදාළ ආඥා පනත් තුනක් (03) නම් කරන්න.

02. "සියලුම අයිතිවාසිකම් සියලුම ළමයිනට යෙදේ" යන වගන්තිය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ජීවත්වීමේ අයිතියට අදාළව ශ්‍රී ලංකාවේ ළමයින් මුහුණපාන ගැටලු පහක් (5) නම් කරන්න.

04. ළමයින්ගේ සෞඛ්‍යය තත්ත්වය නංවාලීම සඳහා රාජ්‍ය නොවන සංවිධානවලට සහාය විය හැකි ආකාර පහක් (05) දක්වන්න.

05. පාසල තුළදී තම සිසුන්ගේ සහභාගිත්ව අයිතිය තහවුරු කිරීම වෙනුවෙන් ගුරුවරයෙකුට ගත හැකි ක්‍රියාමාර්ග තුනක් (03) ලියන්න.

06. ශ්‍රී ලංකාවේ ළමුන් සඳහා වන ක්‍රියාකාරී සැලැස්මේ ඇතුළත් මූලික නිෂ්ටා පහක් (05) නම් කරන්න.

07. ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ඉහල නැංවීමෙහිලා යෙදෙන සන්නිවේදන උපාය මාර්ග වැඩිදියුණු කිරීමට යෝජනා පහක් (05) ඉදිරිපත් කරන්න.

08. පාසල් විද්‍යාගාරය තුළදී ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා විද්‍යා ගුරුවරයාට දැරිය හැකි වගකීම් පහක් (05) ලියන්න.

(ලකුණු 5 x 8 = 40)

00045

## 2 වන කොටස

09. (i) පුරාණ ලංකාවේ ළමා අයිතීන් සම්බන්ධව පැවැති තත්ත්වය විස්තර කරන්න.

(ලකුණු 08)

(ii) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ළමා අයිතිවාසිකම් වැඩි දියුණු කිරීම සඳහා ගෙන ඇති පියවර පැහැදිලි කරන්න. (ලකුණු 12)

10. (i) ළමයින්ගේ "වර්ධනය" හා "සංවර්ධනය" යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ලකුණු 05)

(ii) ළමයින්ගේ වර්ධනය සහ සංවර්ධනය සඳහා ඇති අයිතිය තහවුරු නොවීමෙන් සමාජය කෙරෙහි ඇතිවන බලපෑම සාකච්ඡා කරන්න. (ලකුණු 15)

11. (i) ශ්‍රී ලංකාවේ 1979-2009 කාලයේ අවතැන් වූ ළමයින්ගේ අයිතිවාසිකම්වල තත්ත්වය පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 10)

(ii) එම ළමයින්ගේ අයිතිවාසිකම් තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා රජය ගන්නා ලද ක්‍රියාමාර්ග සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. ළමා අයිතිවාසිකම් සුරැකීමෙහි ලා ගුරුවරයාගේ භූමිකාව සුදුසු නිදසුන් දක්වමින් විභාග කරන්න. (ලකුණු 20)

13. (i) ශ්‍රී ලංකාව තුළ ළමා අපයෝජනය කෙරෙහි බලපාන ප්‍රධාන සාධක තුනක් (03) සඳහන් කරන්න. (ලකුණු 06)

(ii) ශ්‍රී ලංකාවේ ළමා අපයෝජනය සහමුලින්ම නැතිකිරීමට නොහැකිවීම කෙරෙහි බලපා ඇති හේතු තුනක් (03) උදාහරණ සමග විස්තර කරන්න. (ලකුණු 14)

14. පහත සඳහන් මාතෘකාවලින් ඕනෑම දෙකක් (02) පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(i) ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය

(ii) ශ්‍රී ලංකාවේ ළමා සුරක්‍ෂණ අධිකාරිය

(iii) ළමයින් දරුකමට හදා ගැනීම

(iv) පාසල තුළ, ළමයින්ගේ සහභාගිත්ව අයිතිය

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

00045

**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**FACULTY OF EDUCATION**
**BACHELOR OF EDUCATION(NATURAL SCIENCES)**
**DEGREE PROGRAMME(2014/2015)-LEVEL5**
**FINAL EXAMINATIONS – 2016**
**ESU3117 – CHILD RIGHTS**
**DURATION – THREE (03) HOURS.**

Date: 09th April 2016 | Time: 1.30 p.m. 4.30 p.m.

**Answer all questions in Part I & three (03) questions from Part II.**

## PART I

01. Name **three (03)** important ordinances related to child welfare, enacted during the period 1930 – 1948.
02. "All rights apply to all children". Explain this statement briefly.
03. Name **five (05)** problems faced by the Sri Lankan children in relation to the right to survival.
04. State **five (05)** ways by which the NGO's can help to improve the status of health of children.
05. Write **three (03)** strategies that can be taken by teacher to ensure his/her student's right to participation; at the school.
06. Name **five (05)** major goals included in the plane of Action for children in Sri Lanka.
07. Make **five (05)** suggestions to improve the communication strategies in raising awareness of Child Rights.
08. Write **five (05)** responsibilities that can be taken by the science teacher to protect the rights of children in the Science laboratories.

(5 x 8 = 40 marks)

## PART II

09. i. Describe the situation of child rights in ancient Lanka.

(08 marks)

ii. Explain the steps taken after independence to improve the child rights situation in Sri Lanka.

(12 marks)

10. i. What is meant by 'growth' and 'development' of Children?

(05 marks)

ii. Discuss the effect on the society in not ensuring the right to growth and development of children.

(15 marks)

11. i. Describe briefly the status of the rights of displaced children of Sri Lanka during 1979 – 2009.

(10 marks)

ii. Discuss the actions taken by the government to improve the status of rights of those children.

(10 marks)

12. Examine with suitable examples the role of the teacher, in safeguarding the rights of children.

(20 marks)

13. i. State **three (03)** major factors that contribute to child abuse in Sri Lanka.

(06 marks)

ii. Describe with examples **three (03)** reasons for the inability to prevent child abuse completely in Sri Lanka.

(14 marks)

14. Write short notes on any **two (02)** of the following.

i. United Nation's convention on the Rights of the Child.

ii. Child protection Authority in Sri Lanka.

iii. Adoption of children.

iv. Participatory right of children in the school.

(10 x 2 = 20 marks)

*-Copyrights reserved -*